18

# සොරබොර වැව

ලංකා ඉතිහාසයෙහි මහත් කාය ශක්තියෙන් යුත් යෝධ පුරුෂයින් ගැන සඳහන් ව ඇත්තේ ය. දුටුගැමුණු රජුගේ නන්දිමිත්‍ර ආදි දස මහා යෝධයින් ගැන ද එළාර රජුගේ දීඝජන්තු ආදි විසි මහා යෝධයින් ගැන ද ගජබාහු රජුගේ නීල මහා යෝධයා ගැන ද විස්මයජනක කරුණු ඉතිහාස පොත්වල දක්නට ලැබේ.



දුටුගැමුණු රජතුමාගේ දස මහා යෝධයන්ට අමතර ව යුද්ධ හමුදවට එක් වූ යෝධයකු පිළිබඳ **ජනකතාවක්** පහත දැක්වෙයි. දුටුගැමුණු රජතුමා මහියංගණ ප්‍රදේශය අත්පත් කර ගැනීමෙන් පසුව මහියංගණ චෛත්‍යය ප්‍රතිසංස්කරණය කිරීමට පටන් ගත්තේ ය. දගැබ බඳවමින් සිටිය දී රජතුමාට බුලත් මෙහෙ වැඩීමට උඩුදුම්බර ප්‍රදේශයේ **කිරිපට්ටිය** නම් ගමෙහි උපන් ශක්ති සම්පන්න පුරුෂයකු පත් කර ගන්නා ලදී. රජවාසල හැමෝම ඔහුට **බුලතා** යි කීහ. ඔහුගේ රාජකාරිය වූයේ දවසකට හත් වරක් බුලත්විට **සාදා** රජතුමාට පිළිගැන්වීමයි.

උදේ හීල වැළඳීමෙන් පසු ද දහවල් දස පැයට අතුරුපසෙන්

පසු ද දහවල් භෝජනයෙන් පසු ද සවස් වරුවේ අතුරු පසෙන් පසු ද තිස් පැය වේලාවට සවස තේ පානයෙන් පසු ද රාත්‍රි භෝජනයෙන් පසු ද රාත්‍රි නිද ගැනීමට පෙර ද බුලත්විට සාද පිළිගැන්විය යුතු විය. එක් වරක් බුලත් මෙහෙ කිරීමෙන් පසු ඊළඟ වාරය පැමිණෙන තුරු අවට සංචාරය කිරීමට බුලතා පුරුදු වී සිටියේ ය.



දිනක් මහියංගණයෙන් උතුරු පෙදෙසෙහි සංචාරයෙහි යෙදුණු බුලතාට ගල් කඳු දෙකක් අතරෙහි පිහිටි පහත් බිමක් දකින්නට ලැබුණේ ය. ඒ අතරින් විශාල දෙළ පාරක් ගලා බසිමින් තිබිණි. දෙළ පාර අහුරා ගල් කඳු දෙක අතර බැම්මක් බැන්ද හොත් අලංකාර වැවක් සාද ගත හැකි බව ඔහුට පෙනුණේ ය. වැව බැන්දෙත් වැවටත් ගඟටත් අතරේ පිහිටි ගව් ගණනක් විශාල භූමිය කුඹුරු කළ හැකි වේවි යැයි බුලතා සිතුවේ ය. රජුට බුලත් පිළිගැන්වීම් අතරතුර ඉතුරු වන සුළු කාලයෙහි වරින්වර වැඩෙහි යෙදීමට මොහු කල්පනා කළේ ය.

බුලතාගේ උදල්ල සාමාන්‍ය මිනිසෙකුට එසවීමටවත් නොහැකි තරම් විශාල එකක් විය. සාමාන්‍ය මිනිසුන් විස්සකටවත් එසවිය නොහැකි තරම් පස් ප්‍රමාණයක් ඔහු එක් වරකට කුඩයෙන් ගෙනෙන්නේ ය.

මෙසේ ගෙනෙන, ගෙනෙන පස්, ගල් කඳු දෙක අතරේ

දමමින් පාග පාගා වැව් කන්ද ගොඩ නැඟුවේ ය. ස්වල්ප කාලයකින් වැව් වේල්ල බැඳීම අවසන් කළ බුලතා එහි ජලය බැහැර කරන සොරොව්ව සෑදීමට අදහස් කළේ ය. වැව් කන්දේ දෙකෙළවරෙහි ම පිහිටියේ ගල් පර්වත ය. ඔහු මැත කෙළවරේ ගල කපා විස්මයාකාර ගල් සොරොව්වක් ද ඈත කෙළවරේ ගලෙහි වැඩි වතුර බැස යාම සඳහා ජල පැන්නුමක් ද සෑදී ය. මේ ආශ්චර්යවත් ගල් සොරොව්ව ඉදිකිරීමට බුලතාගේ කටුවට හා මිටියට වැඩි කලක් ගත නොවී ය.




බුලතාගේ භාර්යාව ද ඔහුට ම සරිලන යෝධ කාන්තාවක් වූවා ය. සාමාන්‍ය ස්ත්‍රීන් විස්සකගේ පමණ ශරීර ශක්තියක් ඇයට තිබුණේ ය. ඈ දිනපතා ම කිරිපට්ටිය ගමේ සිට තම ස්වාමි පුරුෂයාට දවල් ආහාර ගෙන ගියා ය. ගමන් පහසුව සඳහා ගල් පඩි පෙළක් සෑදීමට ඇයට සිත් විය. ඈ යන විට ගල් කීපයක් ද එන විට ගල් කීපයක් ද ගෙනැවිත් පඩි පෙළක් බැන්ද ය. එහි අගය වැටහුණු බුලතා ද කඳු මුදුනට විශාල ගල් ගෙනැවිත් දමා ඒවා බැඳීම භාර්යාවට පැවරුවේ ය.

අඹුසැමි දෙදෙනාගේ මේ වැඩ දෙක ද, දුටුගැමුණු රජතුමාගේ දගැබ අලුත්වැඩියා කිරීමේ කටයුතු ද එකවර නිම විය. මහියංගණ චෛත්‍යයෙහි කොත පැලඳවීමේ උත්සවයට මාගම්පුර, සිතුල්පව්ව ආදි ස්ථානවල වැඩ විසූ දහස් ගණන් භික්ෂූන් වහන්සේලා වැඩම කළහ. එමෙන් ම රුහුණු රටෙන් විශාල ජන සංඛ්‍යාවක්

ද සහභාගි වූහ. මෙම උත්සවය අවසාන වූ දිනයෙහි බුලතා රජතුමා ඉදිරියට පැමිණ "දේවයන් වහන්ස, මම තනි ව ම වැව් පොඩ්ඩක් බැන්දෙමි. එය බලනු පිණිස වඩින මෙන් මම ආරාධනා කරමි" යැයි සැල කළේ ය. බුලතාගේ ඉල්ලීම පිළිගත් රජතුමා සිවුරඟ සෙනඟ පිරිවරා වැව බලන්නට ගියේ ය.



පෙනෙන තෙක් මානයේ වතුර පිරී රැළි ගසමින් තිබුණු වැව දුටු රජතුමාගේ ප්‍රීතිය නිම්හිම් නැති විය. රජු සමග පැමිණ සිටි මැති ඇමති සෙන්පති ආදී පිරිස ද මහජනයා ද තනි මිනිසකුගේ වැඩක් වූ මේ මහා වැව දැක පුදුමයට පත් වූහ.

"දරුව, තෝ මේ වැඩය සඳහා තව කොපමණ දෙනකුගේ සහාය ලබාගත්තෙහි ද?" යි රජතුමා ප්‍රශ්න කළේ ය.

"දේවයන් වහන්ස, මට සප්‍රාණික කිසිවකුගේ සහාය නොලැබුණේ ය. මට සහාය ලැබුණේ අප්‍රාණික මේ වස්තූන්ගෙන්" යැයි පසෙක සඟවා තිබූ උදැල්ලත්, කුඩයත්, කටුව සහ මිටියත් රජතුමාට පෙන්වූයේ ය.

එම ද්‍රව්‍ය දුටු රජතුමා ඔහුගේ ශරීර ශක්තිය තේරුම් ගෙන ප්‍රීතියට පත් වී "දරුව! තොපගේ ඉතා හරබර වාරි කර්මාන්තය ගැන මම ඉමහත් සතුටට පත්වීමි. රට ජාතිය දියුණුවට හා මතු පරම්පරාවට තොපගේ වැව් කර්මාන්තය පිහිට වන්නේයැ" යි කියා ප්‍රශංසා කළේ ය.

එද පටන් එම වැව "හරබර වැව" නමින් ප්‍රසිද්ධ විය. "හර බර" යන්න පසු කලක දී සරබර, සොරබර ආදි වශයෙන් උච්චාරණය වී පසුව "සොරබොර" යන නමට පෙරළුණේ යැයි සිතිය හැකි ය.



දුටුගැමුණු රජතුමා, බුලතා යෝධයා ද ඔහුගේ භාර්යාව ද කැඳවා ගෙන එවකට මහියංගණයේ තාවකාලික මාලිගාවෙහි සිටි මව් බිසොව වෙත පැමිණියේ ය. බුලතා විසින් කරන ලද වැව ගැනත් භාර්යාව විසින් කරන ලද ගල් පඩි පෙළ ගැනත් ඒවායේ ප්‍රයෝජන ගැනත් රජතුමා විස්තර කළේ ය.

ඒ ඇසූ විහාර මහා දේවී බලවත් ප්‍රීතියට පත් ව තමන් ගෙල පැළඳි වටිනා මුතු මාලය බුලතා ගේ භාර්යාවට පළඳවා උපහාර දැක්වූවා ය. රජතුමා ද තමන් කර පැළඳි වටිනා ස්වර්ණමය උර පළඳනාව ගලවා බුලතා යෝධයාගේ කර පළඳවා උපහාර දැක්වූයේ ය. රජතුමා ඔහුට ගමක් සහ නම්බු නාමයක්ද පිරිනැමුවේ ය. නන්දිමිත්‍ර යෝධයාගේ ඉල්ලීම අනුව බුලතා යෝධයා ද දුටුගැමුණු රජතුමාගේ යුද හමුදවට බඳවා ගන්නා ලදී. මහියංගණ ප්‍රදේශයේ ව්‍යවහාරයෙහි පවත්නා ජන කවියක් මෙසේ ය.

ඔන්න බලාපන් බුලතා කරපු බලේ
යතුරු දපු ගල් දොර යට වතුර හැලේ
එන යන්නෝ ඉඩ නැර ම බැලුම් ගලේ
සොරබොර වැව නුදුටු ඇස් මොටද පින් කළේ

***ඩී. පී. වික්‍රමසිංහ***
***- මග දිගට ජන කතා***

## පැහැදිලි කිරීම්

**දස පැය** – පැය 10 (මෙහි දක්වෙන්නේ සිංහල පැය ක්‍රමයයි)

**මෙහෙ වැඩීම** – සංග්‍රහ කිරීම

**සොරොව්ව** – වැවක ජලය පාලනය කිරීම සඳහා තැනූ දෙරටුව

**සිව්රඟ සෙනඟ** – ඇත්, අස්, රිය, පාබල

## අවබෝධය

1. මෙහි සඳහන් වන ශක්තිමත් පුරුෂයාගේ උපන් ගම නම් කරන්න. ඔහුට "**බුලතා**" යන නම ලැබුණේ කෙසේ ද?
2. "**රජතුමාට බුලත් මෙහෙ කිරීම**" යනුවෙන් හැඳින්වූ කාර්යය විස්තර කරන්න.
3. බුලතා සොරබොර වැව සෑදූ ආකාරය ඔබේ වචනයෙන් කියන්න.
4. බුලතා යෝධයා සිදු කළ කාර්යය රජතුමා අගය කළේ කෙසේ දැයි පැහැදිලි කරන්න.
5. මෙම ජන කතාව අනුව '**සොරබොර වැව**' යන නම ඇති වූ ආකාරය විස්තර කරන්න.

## භාෂා ක්‍රියාකාරකම්

6. "**පුදුමය ඇති කරවන**" යන අදහස දීමට මෙම පාඩමෙහි යොදා ඇති වචන ලියන්න.

   i. ...................... ii. ..........................

7. පහත දක්වෙන වාක්‍යවලින් හැඟැවෙන අදහස් වෙනත් වචනවලින් විස්තර කරන්න.

i. ගල් සොරොව්ව ඉදිකිරීමට බුලතාට වැඩි කලක් ගත නොවී ය.

ii. මට සහාය ලැබුණේ මේ අප්‍රාණික වස්තූන්ගෙනි.

iii. බුලතා, දස මහා යෝධයින්ට නොදෙවෙනි ශරීර ශක්තියෙන් යුක්ත ය.

8. තනි වචනයක් ලියන්න.

i. රනින් කරන ලද

ii. ලීයෙන් කරන ලද

iii. කැඩී බිඳී ගොස් ඉතිරි වූ කොටස්

iv. කැඩුණු බිඳුණු දේ නැවත සෑදීම

v. රජතුමා රාජ සභාවේ හිඳ ගන්නා ආසනය

9. මුලින් දී ඇති පදයට සමාන අර්ථය දෙන පදය තෝරා ලියන්න.

i. රජතුමා : දිනිඳු, තරිඳු, නිරිඳු, පසිඳු

ii. පෙදෙස : වාසය, දේශය, රට, ප්‍රදේශය

iii. කිරුළ : කිරළ, කිරලා, ඔටුන්න, පිරුළ

iv. සතුට : ශෝකය, ප්‍රීතිය, දොම්නස, කනගාටුව

v. නිසසල : ස්ථිර, චංචල, නිශ්චල, තිර

10. (අ) විරුද්ධ තේරුම දෙන ක්‍රියා පදය පහත සඳහන් කොටුවේ ඇති වචන අතුරෙන් සොයා හිස් තැනෙහි ලියන්න.

i. නැඟ එයි ..........................

ii. ආරම්භ කරයි ..........................

iii. පිපෙයි ..........................

iv. පිළිගනියි ..........................

v. ප්‍රශංසා කරයි. ..........................

| | | |
|---|---|---|
| පරවෙයි | ප්‍රතික්ෂේප කරයි | පටන් ගනියි |
| බැස යයි | අවසන් කරයි | නින්ද කරයි |

(ආ) කළු අකුරින් යෙදී ඇති ක්‍රියා පදය වෙනුවට එහි විරුද්ධ තේරුම දෙන ක්‍රියා පදය යොදමින් ඡේදය නැවත ලියන්න.

හිරු **නැග එයි.** කැලේ ගස්වල මල් **පිපෙයි.** යෝධයා වැව සෑදීම **ආරම්භ කරයි.** යෝධයාගේ බිරිඳ පඩි පෙළ සෑදීම **ආරම්භ කරයි.** රජතුමා යෝධයාට **ප්‍රශංසා කරයි.** යෝධයා තෑග්ග **පිළිගනියි.**

## පැවරුම්

1. පාසලේ උදෑසන රැස්වීමේ දී කරන කතාවක් ලෙසට සොරබොර වැව සෑදුණු ආකාරය කියන්න.
2. මෙම කතාවේ සඳහන් වන කරුණු ඇසුරෙන් පහත දක්වෙන චරිත ගැන වාක්‍ය දෙක තුනක් ලියන්න.

    i. දුටුගැමුණු රජතුමා

    ii. විහාර මහා දේවි

    iii. බුලතා යෝධයා

    iv. බුලතා යෝධයාගේ බිරිඳ